# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය / Date | 2025.04.13 පැය 0825 | දුරකථන අංකය / Tel.NO | 011-2887973 |
| මගේ අංකය / My NO | D/Media/Out/723/2025 | විද්‍යුත් ලිපිනය / E-Mails | dir.media@police.gov.lk |


**අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් ලොරි රථයකින් ප්‍රවාහනය කළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - තංගල්ල පොලිස් ස්ථානය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපාරධ සහ මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.13 වන අද දින අළුයම් කාලයේ තංගල්ල පොලිස් වසමේ කුඩාවැල්ල ධීවර වරායට ඇතුළු වන දොරටුව ආසන්නයේදී තංගල්ල පොලිස් ස්ථානයේ රථවාහන අංශයේ නිලධාරින් දෙදෙනෙකු විසින් සැකකටයුතු ලොරි රථයක් නවතා පරීක්ෂා කර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 65 ග්‍රෑම් 720 ක්, හෙරොයින් කිලෝ 52 ග්‍රෑම් 280 ක්, සැටලයිට් දුරකථන දෙකක් හා ලොරි රථය සමඟ ලොරි රථයේ රියදුරු සහ රිය සහයක** අත්අඩංගුවට ගෙන ඇත

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 සහ 35 වයස් වල පසුවන පැපිලිවෙල සහ ගුන්නැපාන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ලොරි රථය නතර කිරීමේදී එහි සිටි එක් සැකකරුවෙකු පලා ගොස් ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**